දඹුල්ල මහා නගර සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දඹුල්ල මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගනණ පනතේ 10(1) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	හදිසි අත්‍යවශ්‍ය පොදු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.1,643,899 ක් ගිණුම්ගත කර නොතිබුණි.	2025 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ආ)	ගිනි නිවන රථයක හා ජීප් රථයක වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරු වටිනාකම් ලබා දීමෙන් පසු අවශ්‍ය කටයුතු සිදු කරන බව.	වටිනාකම් තක්සේරුකර ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	1995 වර්ෂයේ දී දඹුල්ල තොග වෙළෙඳපොළ ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබා ගෙන තිබුණු සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගෙවිය යුතු එකතුව රු.26,164,995 ක ණය ශේෂය ගිණුම්ගත කර නොතිබුණි.	2025 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ CCTV කැමරා පද්ධති 02ක් මිලදී ගැනීම හා සිනමා ශාලාවේ අළුත්වැඩියාවන් වෙනුවෙන් දරා තිබුණු එකතුව රු.1,000,737 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	වියදම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව.	-එම-
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාබනික පොහොර තොගයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.3,362,500 ක් කාබනික පොහොර තොගය සමාලෝචිත වර්ෂයේ වටිනාකම ලෙස ගිණුම්ගත කර තිබුණි.	තොග වටිනාකම් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කරන බව.	-එම-

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය	නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කරන බව.	ගිණුම් ශේෂ නිවැරදි කළ

රු.956,786,131ක් වී තිබුණ ද, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු. 961,145,410 ක් වී තිබීම හේතුවෙන් රු.4,359,278 ක නොසැසඳීමක් පැවතුණි.		යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.38,598,616 ක වත්කම් විෂයන් 04 කට අදාළ ලේඛන, උපලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	උප ලේඛන හා ලිපිගොනු සොයා බලා නිවැරදි කිරීමට හා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව	ගිණුම් ශේෂයන්ට අදාල ලේඛන, උපලේඛන හා ලිපිගොනු පිළියෙල කළ යුතුය.

1.6.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ දීමනා ලබන නිලධාරියෙකුට වැඩ බැලීමේ වැටුපට අමතරව සංයුක්ත දීමනා ගෙවීමට ප්‍රතිපාදන සලසා නොතිබියදී දඹුල්ල මහා නගර සභාවේ වැඩ බලන ගණකාධිකාරිවරයා එම කාර්යාලයට යාම වෙනුවෙන් 2023 දෙසැම්බර් සිට 2024 ජූනි දක්වා කාලය තුළ රු.42,000ක සංයුක්ත දීමනා ගෙවා තිබුණි.	ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාරව සංයුක්ත දීමනා ගෙවා ඇති බව.	ගෙවන ලද සංයුක්ත දීමනා නැවත අය කර ගත යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වන වගන්තිය**	වරිපනම් බදු දේපළ වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, 2011 වර්ෂයේ වරිපනම් තක්සේරුව භාවිතා කර සමාලෝචිත වර්ෂයේ ද වරිපනම් අයකර තිබුණි.	තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සිදු කිරීමට මූලික කටයුතු සිදු කරමින් පවතින බව.	බදු ප්‍රතිශෝධන සිදු කර වරිපනම් අය කළ යුතුය.

(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
(i).	2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධනය වූ මු.රෙ. 371 (2) (ආ)	වර්ෂ 04 කට අධික කාලයක් ගත වී ඇති රු. 2,894,177 ක අත්තිකාරම් 03 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් මත අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කරන බව.	අත්තිකාරම් නිරවුල් කළ යුතුය.
(ii).	මු.රෙ.571 (3)	2022 සිට 2024 දක්වා කාලයට අදාළ කාලය ඉකුත් වී ඇති රු.840,426 ක තැන්පතු 26 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරන බව.	කාලය ඉකුත් වූ තැන්පතු නිරවුල් කළ යුතුය.
(iii).	මු.රෙ.507 හා මු.රෙ.756	2023 හා 2024 වර්ෂ වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ තොග සමීක්ෂණ සිදු කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කඩිනමින් සිදු කරන බව.	වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතුය.
(iv).	මු.රෙ.1646	මහ නගර සභාවෙහි වාහන 35 ක ධාවන සටහන් මාස 03 සිට වසර 05 දක්වා කාලයක සිට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	රියදුරු හිඟය මත ආදේශක රියදුරන් යොදවා ගැනීම හේතුවෙන් ධාවන සටහන් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව.	ධාවන සටහන් මාසිකව විගණනයට ඉදිරිපත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.40,223,502 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.66,694,541 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	ආදායම් ප්‍රභවය	2024 ඇස්තමේන්තුගත ආදායම	2024 බිල්කළ ආදායම	2024 රැස්කළ ආදායම	2024 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	2023 ඇස්තමේන්තුගත ආදායම	2023 බිල්කළ ආදායම	2023 රැස්කළ ආදායම	2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(I)	වරිපනම් හා බදු	23,700,000	43,987,664	30,688,141	19,411,973	44,950,000	25,913,498	33,244,487	6,112,450
(II)	කුලී	26,859,400	31,695,462	31,791,054	17,102,156	23,332,620	27,037,346	29,482,951	17,197,748
(III)	බලපත්‍ර ගාස්තු	9,780,000	9,800,951	9,805,951	1,768,036	33,495,000	9,711,744	10,211,549	1,773,036
(IV)	වෙනත් ආදායම්	51,732,000	74,848,966	81,770,951	35,859,068	56,825,000	102,874,425	74,902,274	42,781,053
	එකතුව	112,071,400	160,333,043	154,056,097	74,141,233	158,602,620	165,537,013	147,841,261	67,864,287

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම් හා බදු		
(i). සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් ශේෂය රු.4,775,263 ක් විය. ඉන් ඒකකයක හිඟය රු.10,000 ඉක්මවූ වරිපනම් ඒකක 66 කින් රු.1,473,193 ක් මහා නගර සභා ආඥා පනතේ 247 (ආ) (4) වගන්තිය අනුව කටයුතු කර හිඟ අය කර නොතිබුණි.	දේපළ තහනම් කිරීම තුළින් හිඟ අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ වරිපනම් අය කළ යුතුය.
(ii). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන 106 කින් රු.673,826 ක් හිඟ වරිපනම් අය කර නොතිබුණි.	හිඟ මුදල් සම්බන්ධයෙන් අදාළ ආයතන ලිඛිතව දැනුවත් කරන බව.	-එම-
(ආ) කුලී		
සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.7,048,926 ක හිඟ කඩ කුලී ආදායමක් හා රු.6,074,222 ක හිඟ කඩකාමර ටෙන්ඩර් ආදායමක් පැවති අතර ඉන් කඩ කාමර 102 කින් රු.5,000 ට වැඩි රු.4,261,645 ක හිඟ කඩ කුලීයක් සහ කඩ කාමර 24 කින් රු.100,000 වැඩි වූ රු.6,354,687 ක හිඟ ටෙන්ඩර් ගාස්තු ආදායමක් අය කර නොතිබුණි.	නව තක්සේරු අනුව ගෙවීම් කිරීමට කඩ හිමියන් අකමැති බැවින් හිඟ කුලී ඇති වූ බව හා ටෙන්ඩර් ගාස්තු අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව.	හිඟ ආදායම් අය කළ යුතුය.
(ඇ) බලපත්‍ර ගාස්තු		
සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 02 කින් ව්‍යාපාර බදු ලෙස රු.1,197,786 ක හිඟයක් පැවති අතර ඉන් රු.1,194,725 ක් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරාසයට අදාළ හිඟ ශේෂයක් විය.	හිඟ ගාස්තු අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	හිඟ ආදායම් අය කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2022 වර්ෂයේ දී රු.1,221,450 ක් වැය කර ඉදිකර තිබුණු දිගම්පතහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ විදුලි පහන් කණු 72 කින් සමන්විත මාර්ගයේ විදුලි ආලෝක පද්ධතිය වන අලි හානි කිරීම හේතුවෙන් හානියට පත්ව තිබුණ ද, එය ප්‍රතිසංස්කරණය කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	කැඩී ඇති විදුලි පහන් නැවත සවි කිරීමට කටයුතු සූදානම් කර ඇති බව.	විදුලි ආලෝක පද්ධතිය ප්‍රතිසංස්කරණය කර භාවිතයට ගත යුතුය.
(ii)	දිගම්පතහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ නොදිරන අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා 2020 වර්ෂයේ දී රු.20,972,104 ක වියදමින් ඉදිකළ තාප දාහකය ක්‍රියාවිරහිතව පැවතීම හේතුවෙන් නොදිරන අපද්‍රව්‍ය පිළිස්සීම විවෘත පරිසරයේ සිදු කිරීම හේතුවෙන් අදාළ යන්ත්‍රයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොතිබුණි.	ලාභදායී ඉන්ධන භාවිතයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව.	කසළ දාහකය අළුත්වැඩියා කර භාවිතයට ගත යුතුය.
(iii)	කවඩිමා පොහොර ව්‍යාපෘතිය ආරම්භ කර වසර 06 කට අධික කාලයක් ගත වී තිබුණ ද, නිෂ්පාදනය කරනු ලබන පොහොර නියමිත ප්‍රමිතියෙන් තොර වී තිබුණු අතර විධිමත් අලෙවි ක්‍රමයක්ද සකස් කර නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට කාබනික පොහොර කිලෝග්‍රෑම් 223,932 ක් අලෙවි කර ගැනීමට නොහැකිව තිබුණි.	2025 වර්ෂයේ දී පොහොර අළෙවිය වැඩි කර ගැනීමට කටයුතු කරන බව.	පොහොර අළෙවියට නිසි ක්‍රමවේද සකස් කළ යුතුය.

(ආ) මහජන සෞඛ්‍ය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත (2017 අගෝස්තු 30 දිනැති අංක එල්.ඩී.බී.4/8/(XII) දරන සංශෝධනය අනුව කිසිදු තැනැත්තෙකු ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම, පිළිස්සීමට සැලැස්වීම, ඉඩදීම හෝ අවසරදීම වරදක් වුව ද, මහා නගර සභාව විසින් නොදිරන අපද්‍රව්‍ය විවෘත පරිසරයේ පිළිස්සීම සිදු කර තිබුණි.	තාප දාහකය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමෙන් පසු නොදිරන අපද්‍රව්‍ය තාප දාහකය වෙත යොමු කරන බව.	තාප දාහකය භාවිතයට ගෙන නොදිරන ද්‍රව්‍ය දහනය කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විදුලි ගබඩාව, කර්මාන්ත හා වාහන ගබඩාවේ පැවති තොග ඒකක 30 කට අදාළ භාණ්ඩ 335 ක් තොග පොතට ඇතුළත් කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර ලේඛනගත කිරීමටත් භාවිතයට ගත නොහැකි අයිතම බැහැර කිරීමටත් කටයුතු කරන බව.	භාණ්ඩ තොග ලේඛනයට ඇතුළත් කළ යුතුය.
(ආ)	2014 – 2022 කාලය තුළ සභාවේ සිදු වූ අනතුරු 02 ක් සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 (4) පරීක්ෂණ වාර්තාව අනුව පාර්ශව 04 කට අදාළව රු.147,427 ක අලාභ අය කිරීම නිර්දේශ කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා අය කර හෝ ඊට නීතිමය ක්‍රියාමාර්ග ගෙන හෝ නොතිබුණි.	අලාභ අය කර ගැනීමට කටයුතු කරන බව.	පරීක්ෂණ වාර්තාවල නිර්දේශ ප්‍රකාරව අලාභ අය කළ යුතුය.
(ඇ)	වාහන 03 ක අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.104(3) ප්‍රාරම්භක පරීක්ෂණ සිදු කර ඇතත් එම අනතුරු සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග හෝ විධිමත් පරීක්ෂණ සිදු කර නොතිබුණි.	මු.රෙ.104(4) පරීක්ෂණ කඩිනමින් සිදු කරන බව.	පරීක්ෂණ කඩිනමින් සිදු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අය කළ යුතුය.
(ඈ)	2023 මාර්තු 19 වන දිනෙන් සභිකධුර කාලය නිමා වීමෙන් අනතුරුව නගරාධිපතිතුමාගේ කාර්යාලය වෙත ලබා දී තිබුණු රු.256,800 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 02 ක් හා වටිනාකම සඳහන් නොවූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 02 ක් නැවත ආපසු භාර දී නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් මු.රෙ.104(3) ප්‍රාරම්භක පරීක්ෂණයක් සිදු කිරීමට මණ්ඩලයක් 2024 පෙබරවාරි 02 වන දින පත් කර ඇතත් සමාලෝචිත වර්ෂය අවසාන දින තෙක්ම පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.	මු.රෙ.104(4) පරීක්ෂණ කඩිනමින් සිදු කරන බව.	පරීක්ෂණ කඩිනමින් සිදු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අය කළ යුතුය.

3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
දඹුල්ල බස්නැවතුම්පොළ කඩ කාමර 09 ක් බදුකරුවන් විසින් මාසික රු.10,000 සිට 50,000 දක්වා වටිනාකමකට අතුරු බදු ලබා දී තිබුණ අතර කඩ කාමර 03 ක් බදුකරුවන් විසින් ඇටෝර්නි බලපත්‍ර මඟින් උප බදුකරුවන් වෙත පවරා දී තිබුණි.	අතුරු බදු කමිටුවක් පත් කර සමීක්ෂණයක් සිදු කරන බව.	කඩ කාමර අතුරු බදු දීමට අදාළව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.

3.4 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති එකතුව රු.82,280,986 ක වත්කම් ඒකක 18 ක හා වටිනාකම හඳුනාගෙන නොමැති වාහන 02 ක් වසර 02 සිට වසර 03 දක්වා කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.	වත්කම් උපයෝජනය කිරිමට කටයුතු කරන බවත් වාහන සඳහා රියදුරන් නොමැති වීම මත උපයෝජනය ගැටළුකාරී වී ඇති බව.	වත්කම් නිශ්කාර්යය වීමට නොදී උපයෝජනය කළ යුතුය.
(ආ)	1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 22 (1) වගන්තිය අනුව ප්‍රජා සහ විනෝද කටයුතු සඳහා සභාවට පවරා ගන්නා ලද ඉඩම් 15 ක් අරමුණු ගත කාර්යයට යොදා නොගෙන වසර 03 සිට 12 දක්වා නිශ්කාර්යව පැවතුණි.	වත්කම් අරමුණුගත කාර්යයන්ට යොදා ගැනීමට කටයුතු කරන බව.	වත්කම් අරමුණුගත කාර්යයන්ට යොදා ගත යුතුය.
(ඇ)	දඹුල්ල මහා නගර සභාව විසින් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත දිගම්පතහා පරිපාලන ගොඩනැගිල්ල රු.27,689,240 ක පිරිවැයක් දරා ඉදිකර 2022 වර්ෂයේ දී විවෘත කර තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දින වන විට ද අපේක්ෂිත කාර්යයට යොදා ගැනීමකින් තොරව නිශ්කාර්යව විනාශවීමට ඉඩහැර තිබුණි.	ඉඩම් පවරා ගැනීමෙන් හා ප්‍රමාණවත් සේවකයින් අනුයුක්ත කළ පසු අපේක්ෂිත කාර්යයෙහි යොදවා ගැනීමට කටයුතු කරන බව.	වත්කම් අරමුණුගත කාර්යයන්ට යොදා ගත යුතුය.
(ඈ)	එකතුව රු.909,225 ක වියදමින් 2021 වර්ෂයේ දී පැයකට ලීටර් 3000 ක ජල ධාරිතාවක් ලබා ගැනීමේ අරමුණින් දිගම්පතහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකර තිබුණු නල ළිඳ භාවිතයට නොගෙන විනාශවීමට ඉඩහැර තිබුණි.	විදුලි වැට අළුත්වැඩියා කිරීමෙන් පසු නල ළිඳ භාවිතයට ගැනීමට කටයුතු කරන බව.	අදාළ ගැටළු විසඳාගෙන වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කරගත යුතුය.
(ඉ)	කාබනික පොහොර නිෂ්පාදනය සඳහා දිගම්පතහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකළ සමාන්තර ගොඩනැගිල්ල සඳහා 2021 වර්ෂයේ එකතුව රු.9,377,100 ක් වටිනා අමානෝ තහඩු 808 ක් හා 2022 වර්ෂයේ මිලට ගත් රු.650,610 ක වැඹි පිහිලි තොගයක් අදාළ ගොඩනැගිල්ලට සෙවිලි කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා නිශ්කාර්යව කසළ කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ ගොඩ ගසා තිබුණි.	දිගම්පතහා වැඩ බිමෙහි අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අදාළ භාණ්ඩ භාවිතා කරන බව.	මිලදී ගත් භාණ්ඩ අදාළ අවශ්‍යතාවය හා අරමුණ වෙනුවෙන් භාවිතා කළ යුතුය.
(ඊ)	රු.443,225 ක මුදලක් වැයකර 2021 වර්ෂයේ දී ස්ථාපනය කර ඇති වරිපනම් බදු අය කිරීමේ මෘදුකාංග පද්ධතිය භාවිතා කර නොතිබුණි.	මු.රෙ.104 (3) පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ප්‍රාරම්භක පරීක්ෂණ සිදු කරන බව.	වරිපනම් මෘදුකාංග පද්ධතිය කඩිනමින් භාවිතයට ගත යුතුය.

(ඉ)	දිගම්පතහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ නල ළිඳ ඉදිකිරීමට පෙර පැයකට ලීටර් 3000ක ජල ධාරිතාවයකින් යුතු රු.450,070 ක් වටිනා ජල මෝටරයක් හා මෝටර් පාලන පැනල මිලදී ගෙන තිබුණ ද, නිශ්ක්‍රීයව පැවතුණි.	විදුලි වැට අළුත්වැඩියා කිරීමෙන් පසු නල ළිඳ භාවිතයට ගැනීමට කටයුතු කරන බව.	අදාළ ගැටළු විසඳාගෙන වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කරගත යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව පරිහරණය කරනු ලබන ඉඩම් කොටස් 18 ක හා වාහන 06 ක අයිතිය සභාව නමින් පවරා ගෙන නොතිබුණි.	පවරා ගැනිමේ කටයුතු සිදුකරමින් පවතින බව.	වත්කම් පවරා ගැනිමට කටයුතු කල යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා සැසඳීමේ දී ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් ද, තෘතීය මට්ටමේ තනතුරු 03 ක් ද, ද්විතීක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 34 ක් ඇතුළුව තනතුරු 41 ක් පුරප්පාඩු හා තනතුරු 34 ක අතිරික්තයක් පැවතුණි.	පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ඉල්ලීම් යොමු කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය.
(ආ)	මහා නගර සභාවේ පවතින පුරප්පාඩු සපුරා ගැනීමෙන් තොරව වර්ෂ 01 ත් 11 ත් අතර කාලයක සිට ක්ෂේත්‍රගත සේවකයින් 35 දෙනෙකු තම නිත්‍ය තනතුර නොවන කාර්යාලගත විෂයන්ට අනුයුක්ත කර සේවයේ යොදවා ගෙන තිබුණි.	පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් පසු නිත්‍ය තනතුරුවල යෙදවීමට කටයුතු කරන බව.	සේවකයන් නිත්‍ය තනතුරුවල රාජකාරියේ යෙදවිය යුතුය.
(ඇ)	මහා නගර සභාව මඟින් නියාමනය වන පෙර පාසලක් නොතිබියදී හා ආරම්භ කිරිමේ පූර්ව සූදානමකින්ද තොරව පෙර පාසල් පාලිකා තනතුරක් සඳහා බඳවාගෙන ඒ වෙනුවෙන් 2019 සැප්තැම්බර් 16 දින සිට වැටුප් ගෙවා තිබුණු අතර එම නිලධාරිනිය පුස්තකාල සහයිකාව වශයෙන් රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් 2024 වර්ෂය සඳහා වැටුප් ලෙස රු.621,480 ක මුදලක් ගෙවා තිබුණි.	පෙර පාසලක් කඩිනමින් ඉදිකර අදාළ තනතුරෙහි යොදවන බව.	අවශ්‍යතාවය අනුව පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය.